# ආගමන සමයේ නුවාතය
# දෙසැම්බර් 22

| පළමුවන කියවීම | 1 සාමුවෙල් 1: 24–28 |
|---|---|

සාමුවෙල්ගේ පළමුවන පොතෙන් උපුටා ගත් කොටසකි.

*සාමුවෙල්ගේ උපත ගැන හන්නා තුති පුදති.*

දරුවා කිරි වැරූ පසු තුන් අවුරුදු වස්සකු ද පිටි කිලෝ ග්‍රෑම් දහසක් ද මිදි යුෂ බඳුනක් ද අරගෙන දරුවා ගෙන ගොස් ෂිලෝහි තිබුණු සමිඳාණන් වහන්සේගේ මාලිගාවට පැමිණුනා ය. එකල සාමුවෙල් කුඩා දරුවකු ව සිටියේ ය. ඔව්හු ගොන් වස්සා මරා දරුවා ඒලී ළගට ගෙනාහ. ඈ ඒලී අමතා, "අනේ ස්වාමිනි, මට සමාවන්න. වරක් ඔබ ළග සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින් සිටි ස්ත්‍රිය මා බව මම දිවුරා කියමි. මේ දරුවා දෙන ලෙස මම යාච්ඤා කළෙමි. සමිඳාණන් වහන්සේ ද මා උන් වහන්සේගෙන් ඉල්ලූ මේ ඉල්ලීම මට ඉටු කළ සේක. එබැවින් මම ද ඔහු සමිඳාණන් වහන්සේට දෙන්නෙමි. ඔහු ජීවත් ව සිටින තෙක් සමිඳාණන් වහන්සේට කැප ය" යි කීවා ය. ඔව්හු එහි දී සමිඳාණන් වහන්සේට නමස්කාර කළහ.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | 1 සාමුවෙල් 2: 1, 4-8 |
|---|---|

පිළිතුර: මා සිත මා ගැළවුම්කාර සමිඳාණන් කෙරෙහි ප්‍රීති වන්නේය.

ගීය: මා සිත සමිඳුන් කෙරෙහි ප්‍රීතිමත් වේ.
මාගේ සවිය සමිඳුන් කෙරෙහි උසස් වී තිබේ.
මාගේ මුවින් මා සතුරන්ට මම සරදම් කරමි.
ඔබ මා ගැළෙවූ නිසා මම ප්‍රීති වන්නෙමි.

බලවතුන්ගේ බලය දුබල වී ඇත. දුබලයෝ බලවත් වී ඇත.
කා බී තර වී සිටි අය කුලී වැඩ කරති.
සාගින්නෙන් පෙළී සිටි අයට සාගින්නක් තවත් නැත.
වඳ ස්ත්‍රියට දරුවන් සත් දෙනෙක් ඇත.
බොහෝ දරුවන් ලැබූ ස්ත්‍රියට දැන් එකෙක් වත් නැත.

මරණය සමිඳුන්ගෙන් ය. ජීවිතය ද සමිඳුන්ගෙන් ය.
පාතාලයට ගෙන යන්නේත්, එයින් ගෙන එන්නේත් සමිඳාණෝ ය.
සමිඳාණෝ දිළිඳු කම ද පොහොසත්කම ද ඇති කරන සේක.
පහත්කම ද උසස්කම ද ගෙන දෙන සේක.

අධිපතීන් සමග හිඳුවන පිණිසත්,
මහිමාසන උරුම කර දෙන පිණිසත්,
එතුමාණෝ දුප්පතා ධූලියෙන් නැගිටුවන සේක.
දිළින්දා කසළ ගොඩින් ඔසවන සේක.
පොළොවේ පදනම් සමිඳාණන්ගේ ය.
එතුමාණෝ ඒවා පිට ලොව පිහිටෙවූ සේක

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සාන්ත සභා ඒකත්වයේ හා විශ්වයේ මූලය වන.
සියළු ජාතීන්ගේ රජාණන් වහන්ස,
වැඩමකර ඔබ වහන්සේගේ ම මැටිල්ලක් වන
මේ මානව සංහතිය ගළවා ගත මැනව.
ආලේලූයා!

සුවිශේසක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

*“පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක”*

එවිට මරිය තුමී මෙසේ උදන් ඇනුවා ය.

“මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ සිත මා මිඳුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි. මක්නිසා ද එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක. හැම පරපුරක් ම මෙතැන් සිට ‘භාග්‍යවන්ති ය’ යි මට කියනු ඇත. පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක. ‘පරිශුද්ධයාණෝ’ යනු එතුමන්ගේ නාමය යි. එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ. සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා, උඩගු උදම් සිතැත්තන් විසුරුවා හැර, මහ නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙළා, දීනයන් ඉහළ නංවා උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට, සදහට ම පොරොන්දු වූ ලෙසට සිය සේවක ඉශ්රායෙල් සෙනග හට දයාව පෙන්වා පිහිට වූ සේක.”

මරිය තුමී, එලිසබෙත් සමග තෙමසක් පමණ නැවතී සිට සිය නිවෙසට පෙරළා ගියා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*